# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.04 පැය 1140 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1987/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

### 01. ඇෂ් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වැල්ලම්පිටිය පොලිස් ස්ථානය.

2025.11.03 වන දින රාත්‍රී කාලයේ වැල්ලම්පිටිය පොලිස් වසමේ මෙගොඩ කොළොන්නාව ප්‍රදේශයේදී වැල්ලම්පිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **ඇෂ් මත්ද්‍රව්‍ය කිලෝ 12 ග්‍රෑම් 212 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 54 ක් වන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැල්ලම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. මාරක රිය අනතුරක් - අක්මීමන පොලිස් වසම.

2025.11.04 වන අද දින අළුයම් කාලයේ අක්මීමන පොලිස් වසමේ නරාවල පෝද්දල මාර්ගයේ නරාවල විහරස්ථානය අසලදී පෝද්දල දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගයෙන් ඉවතට පැන පස් කණ්ඩියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු බරපතල තුවාල ලබා කරාපිටිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 36 ක් වූ නරාවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අක්මීමන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**